# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 50 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 50 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 1/71

**1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත සංශෝධනය කිරීම පිණිස ද 1968 අංක 22 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා (වන්දි නිශ්චය කිරීමේ) විශේෂ විධිවිධාන පනත ඉවත් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 50 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතේ 47 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අතිරේක අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන්, මෙසින් සංශෝධනය කරනු ලැබේ :— 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

> " තවද එසේ වුවත් එම දේපළ ඉඩමකින් හෝ ගොඩනැගිලිවලින් සමන්විත වන අවස්ථාවක ගෙවිය යුතු වන වන්දි මුදල, එම ඉඩම හෝ ගොඩනැගිලි හෝ සංස්ථාව සතු කරනු ලැබූ දින යෙහි දී එම ඉඩම හෝ ගොඩනැගිලි විවෘත වෙළෙඳ පොළෙහි විකුණන ලද නම් එම ඉඩම හෝ ගොඩනැගිලි සඳහා ලැබෙන මිලට සමාන මුදලක් විය යුතු ය. ".

3. 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙසින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :— 48අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"වන්දි නිශ්චය කිරීමේ දී ඇතැම් ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම ගණන් නො ගත යුතු බව සහ ඇතැම් අඩු කිරීම් කළ යුතු බව.

48අ. සංස්ථාව සතු කර ගනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් ඉඩමක් වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීමෙහි දී—

(1) එම ඉඩම එසේ සතු කර ගනු ලැබූ හෝ බල කර ලබා ගනු ලැබූ දිනට පෙර යම් දිනයක, විදේශ සතු යම් ඛනිජ තෙල් සමාගමක් විසින් එම ඉඩමෙහි යම් ගොඩනැගිල්ලක් ඉදි කර හෝ වෙනත් යම් වැඩි දියුණු කිරීම් සිදු කර තිබෙන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි 47 වන වගන්තිය යටතේ එම ඉඩමෙහි වෙළෙඳ අගය හෝ 48 වන වගන්තිය යටතේ ගෙවිය යුතු කුලිය හෝ ආගණනය කිරීමෙහි ලා එම ගොඩනැගිල්ල හෝ වැඩි දියුණු කිරීම් ගණන් ගැනීම නො කළ යුතු ය; තවද

2—ඒ 01635—9,982 (73/10)

(2) එම ඉඩම අවස්ථාවෝචිත පරිදි එසේ සතු කර ගනු ලැබූ හෝ බල කර ලබා ගනු ලැබූ දිනට පසු යම් කාලයක් සඳහා කුලී වශයෙන් අයිතිකරු වෙත කලින් ගෙවා තිබෙන යම් මුදලක් වන්දි මුදලින් අඩු කර ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වන්දිය බාර නො ගැනීම ආදිය කෙරෙන අවස්ථා සඳහා විධිවිධාන.

54. මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ කල්හි ඔහු එය බාර නො ගන්නා අවස්ථාවක හෝ එම තැනැත්තා මිය ගොස් ඇති හෝ එම තැනැත්තා නොමැති හෝ එම තැනැත්තා කවරෙක් දැ යි දැනගත නො හැකි අවස්ථාවක, එයට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගැනීම පිණිස ඒ වන්දි මුදලෙහි ප්‍රමාණය රුපියල් හත් සිය පණහකට වැඩි වීම හෝ වැඩි නො වීම අනුව එය යම් දිසා අධිකරණයකට හෝ රික්වෙස්ට් අධිකරණයකට ගෙවිය යුතු ය.".

54අ, 54ආ සහ 54ඇ යන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්ති යෙහි ඇතුළත් කිරීම.

5. 54 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 54අ, 54ආ සහ 54ඇ යන වගන්ති ලෙස බල පැවැත්විය යුතු ය :—

"1970 අගෝස්තු 1 වන දින හෝ එදිනට පසුව සංස්ථාව සතු කර ගනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ දේපළ වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය.

54අ. මේ පනත යටතේ සංස්ථාව සතු කර ගනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ දේපළ වෙනුවෙන්, එම සතු කර ගැනීම හෝ බල කර ලබා ගැනීම 1970 අගෝස්තු පළමු වන දින හෝ ඉන් පසුව කරනු ලැබූ අවස්ථාවක දී, එම දේපළ සඳහා වන්දි මුදල සම්බන්ධයෙන් අමාත්‍ය වරයා සහ යම් තැනැත්තකු අතර එළඹි තිබුණු යම් ගිවිසුමක් අනුව, අමාත්‍යවරයා විසින්, ගෙවන ලෙස සංස්ථාවට විධාන කෙරෙන යම් මුදලක් මේ පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මණ්ඩලය විසින් එම තැනැත්තා වෙත වන්දි වශයෙන් ගෙවිය හැකි ය.

වන්දි සම්බන්ධයෙන් අත්තිකාරම් මුදල් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිට ඇති බලය.

54ආ. (1) මේ පනත යටතේ වන්දි සඳහා වූ හිමිකම් පෑමක් නිශ්චය කිරීමට පෙර, ඒ වන්දි ලැබීමට හිමිකම් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් සලකනු ලබන තැනැත්තකුට ඔහු විසින් අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි අතර එසේ ගෙවන ලද යම් මුදලක් ඔහුට ප්‍රදානය කරනු ලබන වන්දි මුදලෙන් අඩු කර ගත යුතු ය.

(2) සංස්ථාව සතු කර ගනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබා ගනු ලැබූ යම් ඉඩමක් සම්බන්ධයෙන් මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු ව ඇති වන්දියක් සම්බන්ධයෙන් අත්තිකාරම් මුදලක් වශයෙන් යම් මුදලක් මේ පනත ආරම්භ වන දිනයට පසුව ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබ ඇති අවස්ථාවක ඒ ගෙවීම (1) වන උපවගන්තිය යටතේ ගෙවන ලද ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, ඒ තැනැත්තාට ප්‍රදානය කරන ලද වන්දි මුදලෙන් ඒ මුදල අඩු කර ගත යුතු ය.

වන්දි ගෙවීම පිළිබඳ අවසානාත්මක භාවය.

54ඇ. යම් ඉඩමක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව වන්දි ගෙවා තිබෙන අවස්ථාවක, එම වන්දිය ගෙවනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සංස්ථාවට විරුද්ධව වැඩිදුර හිමිකම් පෑමක් කරනු ලැබීමට ඉඩ නො දිය යුතු අතර, එවැනි වැඩිදුර හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සංස්ථාවට විරුද්ධව යම් අධිකරණයක දී කිසි ම නඩු පැවරීමක් නො කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "විනිශ්චය අධිකාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) වන්දි විනිශ්චය අධිකාරයක් මේ පනතෙහි කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය යුතු අතර එම සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තිදෙනෙක් අධිකරණ හෝ නෛතික කටයුතු පිළිබඳ පළපුරුද්ද තිබෙන තැනැත්තන් විය යුතු ය."; තවද

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික සහ විනිශ්චය අධිකාරයේ වියදම්.

56. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයන් අනුව විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

(2) විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික සහ විනිශ්චය අධිකාරයේ වෙනත් වියදම්, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එම කාර්යය සඳහා සංස්ථාව විසින් සපයා ඇති මුදල්වලින් ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විනිශ්චය අධිකාරයේ රැස්වීම.

57. (1) වන්දි පිළිබඳ ප්‍රදාන සඳහා විනිශ්චය අධිකාරය වෙත කරන ලද යොමු කිරීම් සලකා බැලීම සහ තීරණය කිරීම පිණිස සභාපති විසින් විනිශ්චය අධිකාරයේ රැස්වීම් කැඳවිය යුතු ය.

(2) විනිශ්චය අධිකාරයේ රැස්වීමකට විනිශ්චය අධිකාරයේ සාමාජිකයන් තිදෙනකු කැඳවිය යුතු අතර, ඔවුන්ගෙන් එක් තැනැත්තකු සභාපති හෝ උප සභාපති විය යුතු ය. කැඳවිය යුතු සාමාජිකයන් සභාපති විසින් තීරණය කළ යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ රැස්වීමකට සභාපති හෝ උප සභාපති කැඳවනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි සභාපති හෝ උප සභාපති විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(4) වන්දි පිළිබඳ ප්‍රදානයක් සඳහා වූ යොමු කිරීමකට විෂය වූ යම් කරුණක් හා සම්බන්ධතාවක් දරන්නා වූ හෝ එහි සම්බන්ධතාවක් දරන යම් තැනැත්තකු විසින් නැතහොත් තැනැත්තකු වෙනුවෙන් ඒ කරුණ පිළිබඳ ව අධිනීතිඥයකු හෝ නීතිඥයකු ලෙස හෝ වෙනත් යම් තත්ත්වයකින් උපදෙස් විමසනු ලැබුවා වූ විනිශ්චය අධිකාරයේ සාමාජිකයකු එම යොමු කිරීම හා සම්බන්ධ විනිශ්චය අධිකාරයේ රැස්වීමක යම් කටයුත්තකදී සහභාගි නො විය යුතු ය.

(5) විනිශ්චය අධිකාරයේ රැස්වීමක් කලින් කල කල් තැබීම හෝ අඛණ්ඩව කල් තැබීම කළ හැකි ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විනිශ් අධිකාර ඉදිරියේ කටයුතු

58. (1) වන්දි පිළිබඳ ප්‍රදානයක් සඳහා වූ සෑම යොමු කිරීමක් ම සලකා බැලීම සහ තීරණය කිරීම විනිශ්චය අධිකාරයේ රැස්වීමක දී කළ යුතු ය.

(2) වන්දි පිළිබඳ ප්‍රදානයක් සඳහා වූ එක් එක් යොමු කිරීම විනිශ්චය අධිකාරය විසින් සලකා බැලීම සහ තීරණය කිරීම පිණිස සභාපති විසින් දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) වන්දි පිළිබඳ ප්‍රදානයක් සඳහා වූ යම් යොමු කිරීමක් සලකා බැලීමේ සහ තීරණය කිරීමේ කාර්යය සඳහා විනිශ්චය අධිකාරයේ සභාපතිට හෝ උප සභාපතිට—

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට සහ ඔවුන්ට පැමිණ සිටීමට බල කිරීමට ;

(ආ) ලේඛන ඉදිරිපත් කළ යුතු යැයි බල කිරීමට ; සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා යම් දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කරවීමට

දිසා අධිකරණයකට තිබෙන සියලු බලතල ඇත්තේ ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය, "අධ්‍යක්ෂ" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

' "විදේශ සතු ඛනිජ තෙල් සමාගම" යන්නෙන් 1965 අංක 19 දරන ලංකා ඛනිජ තෙල් (විදේශ හිමිකම් පැමි) වන්දි පනතෙහි "විදේශ සතු ඛනිජ තෙල් සමාගම" යන්න පිළිබඳ අර්ථකථනයෙහි අර්ථානුකූල වූ යම් විදේශ සතු ඛනිජ තෙල් සමාගමක් අදහස් වේ .'.

සතු කර ගනු ලැබූ ඉඩම්වල අයිතිකරුවන් ගෙන් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද යම් මුදලක්, අය කර ගැනීමට විදේශයතු ඛනිජ තෙල් සමාගම්වලට අයිතිවාසිකමක් නොමැති ලෙස සැලකිය යුතු බව.

**12.** සංස්ථාව සතු කර ගනු ලැබූ හෝ සංස්ථාව සඳහා බල කර ලබාගනු ලැබූ යම් ඉඩමක අයිතිකරු වෙත, එම ඉඩම වෙනුවෙන් වූ කුලිය වශයෙන් යම් විදේශ සතු ඛනිජ තෙල් සමාගමක් විසින් එම ඉඩම එසේ සතු කර ගනු ලැබූ හෝ බල කර ලබා ගනු ලැබූ දිනට පසු යම් කාලයක් සඳහා යම් මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබෙන අවස්ථාවක, එම මුදල එම අයිතිකරුගෙන් හෝ සංස්ථාවෙන් හෝ අය කර ගැනීමට එම සමාගමට කිසිම අවස්ථාවක අයිතිවාසිකමක් නො තිබුණු ලෙස සහ නො තිබෙන ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, එවැනි යම් මුදලක් අය කර ගැනීම පිණිස එවැනි යම් අයිතිකරුවකුට විරුද්ධව එවැනි යම් සමාගමක් විසින් පවරන ලද යම් නඩුවක් මේ පනත ආරම්භ වන දිනට පෙර දිනයෙහි යම් අධිකරණයක විභාගයට භාජනව තිබෙන අවස්ථාවක එම නඩුව මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව තීරණය කළ යුතු ය. තවද එවැනි තීරණයක කාර්යය සඳහා මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන, එම නඩුව පවරනු ලැබූ දිනට පෙර දින යෙහි වලංගු වූ ලෙස සැලකිය යුතු ය.

1968 අංක 22 දරන පනත ඉවත් කිරීම.

**13.** (1) 1968 අංක 22 දරන ඛනිජ තෙල් සංස්ථා (වන්දි නිශ්චය කිරීමේ) විශේෂ විධිවිධාන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1968 අංක 22 දරන ඛනිජ තෙල් සංස්ථා (වන්දි නිශ්චය කිරීමේ) විශේෂ විධිවිධාන පනත ඉවත් කිරීම ගැන නො තකා—

(අ) යම් ඉඩමක් සම්බන්ධයෙන් වන්දි සඳහා ඒ පනත යටතේ යම් හිමිකම් පෑමක් කරනු ලැබ ඇති විට අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින්, නැතහොත් සමාලෝචන මණ්ඩලය වෙත කරන ලද අභියාචනයක දී ඒ මණ්ඩලය විසින්, ඒ පිළිබඳ ව තීරණයක් කර නොමැති අවස්ථාවක දී එම හිමිකම් පෑම 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතේ 44 වන වගන්තියෙහි විධිවිධාන අනුව කර ඇති ලෙස සැලකිය යුතු ය;

(ආ) එම ඉඩම සම්බන්ධයෙන් වන්දි සඳහා වූ අලුත් හිමිකම් පෑමක් කිරීම අවශ්‍ය නො වන්නේ ය.;

(ඇ) ඉහත කී ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතෙහි, වන්දි තීරණය කිරීමට සහ ගෙවීමට අදාළ සෙසු විධිවිධාන වන්දි සඳහා වූ එම හිමිකම් පෑම සම්බන්ධයෙන් ඒ අනුව අදාළ වන්නේ ය; තව ද

(ඈ) ඉහත කී ලංකා ඛනිජ තෙල් සංස්ථා පනතෙහි විධිවිධාන යටතේ පිහිටුවනු ලද හෝ සංස්ථාපනය කරන ලද වන්දි විනිශ්චය අධිකාරයට ඒ හිමිකම් පෑම විභාග කර නිශ්චය කිරීම පිණිස බලය, අධිකාරය සහ අධිකරණ බලය ඇතැයි සැලකිය යුතු අතර එකී බලය, අධිකාරය සහ අධිකරණ බලය එයට තිබෙන්නේ ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි “සංස්ථාව” යන්නට සහ “විදේශ සතු ඛනිජ තෙල් සමාගම” යන්නට මේ පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියෙහි පිළිවෙළින් ඒවාට දී තිබෙන්නා වූ අර්ථ ම ඇත. අර්ථ නිරූපණය.